# විශ්වවිද්‍යාල මඟින් නොමිලේ සපයන අන්තර්ජාල පහසුකම් විද්‍යාර්ථයන්ගේ අධ්‍යයන සාර්ථකත්වයට ඇති කරන බලපෑම

කේ. එල්. අයි. බී. ගුණවර්ධන[1]

**සංක්ෂේපය**

විශ්වවිද්‍යාල මඟින් විද්‍යාර්ථයන්ගේ අධ්‍යයනය සඳහා වෙන් කරන ලද ප්‍රතිපාදනයන්ගෙන් කොටසක් අන්තර්ජාල පහසුකම් සැපයීමට යොදාගෙන ඇත. වර්තමානයේ දී නව දැනුම සොයා ගැනීමට හා බෙදාහදා ගැනීමේ මාධ්‍යයක් ලෙස ද අන්තර්ජාලය හඳුන්වයි. ඒ අනුව අන්තර්ජාල පහසුකම් නොමිලේ ලබාදීම සිසුන්ගේ අධ්‍යයන සාර්ථකත්වයට කෙසේ බලපායිද යන්න මෙහිදී පර්යේෂණ ගැටලුව ලෙස යොදාගනී. නොමිලේ අන්තර්ජාල පහසුකම් සැලසීම සිසුන්ගේ අධ්‍යයනයන්ට කරන සෘණ හා ධනාත්මක බලපෑම ප්‍රමාණාත්මකව මැනීම මෙම පර්යේෂණයේ අරමුණයි. මේ සඳහා කැලණිය විශ්වවිද්‍යාලයේ විද්‍යාර්ථයන් 100 ක් නියැදිය ලෙස යොදා ගෙන ප්‍රශ්නාවලියක් ඇසුරින් දත්ත රැස් කෙරිණි. සිසුන්ගේ අධ්‍යයන/අධ්‍යයන නොවන කටයුතු සඳහා අන්තර්ජාලය භාවිත කරන කාලය හා සිසුන්ගේ අධ්‍යයන සාර්ථකත්වය ප්‍රමාණාත්මකව මනින GPA සාධකය පිළිබඳව විශේෂ අවධානය ප්‍රශ්නාවලිය තුළදී යොමු විය. මෙම දත්ත ප්‍රස්තාර, වගු, හා ප්‍රතිශත වැනි සරල සංඛ්‍යාන ක්‍රමවේදයන් හා ප්‍රමාණාත්මක දත්ත විශ්ලේෂණ ක්‍රම මඟින් විශ්ලේෂණය සිදු කරන ලදී. ඒ අනුව දිනකට නොමිලේ ලබාදෙන අන්තර්ජාල පහසුකම අධ්‍යයන කටයුතු සඳහා පැය 02කට වැඩි කාලයක් භාවිත කරන පිරිස 83% ක් විය. ඔවුන්ට සැලකිය යුතු GPA අගයක් පැවතිණි. පැය 02කට අඩුවෙන් භාවිත කරන පිරිස 17% ක් විය. ඔවුන්ගේ GPA අගය අඩු මට්ටමක පැවතිණි. අධ්‍යයන නොවන කටයුතු සඳහා පැය 02 කට වැඩියෙන් භාවිත කරන පිරිස 14% ක් විය. ඔවුනට පහළ GPA අගයක් හිමිවිය. පැය 02කට අඩුවෙන් භාවිත කරන පිරිස 86% ක් විය. ඔවුන්ගේ GPA අගය සැලකිය යුතු මට්ටමක පැවතිණි. මෙම දත්ත විශ්ලේෂණයන් මත පැහැදිලි ව එළඹිය හැකි නිගමනය වන්නේ, නොමිලේ සැපයෙන අන්තර්ජාල පහසුකම භාවිතයෙන් වැඩි විද්‍යාර්ථීන් පිරිසක් එනම් 80% කට වැඩි ප්‍රමාණයක් තම අධ්‍යයන කටයුතුවල සාර්ථකත්වයක් අත්පත් කර ගන්නා බවයි.

**මුඛ්‍ය පද :** අන්තර්ජාල භාවිතය, අන්තර්ජාල පහසුකම්, අධ්‍යයනය

[1] ආර්ථික විද්‍යා අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, bhagyaisuri2@gmail.com